මාර්ග ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය - 2014
--------------------------------------------------------------

මාර්ග ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2004 ජුනි 16 දින එළඹි අංක 2080 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ iv වාවස්ථාවේ 4.06 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------------

මාර්ග ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය (මාසංඅ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මාර්ග ජාලය කාර්යක්ෂමව යොදා ගැනීමේදී ශ්‍රී ලංකා රජයට සහායවීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,969 කට සමාන එජඩො මිලියන 20 ක් වන අතර ඉන් රු.මිලියන 1,476.75 කට සමාන එජඩො මිලියන 15 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි.

ව්‍යාපෘතිය එහි කටයුතු 2004 සැප්තැම්බර් 15 දින ආරම්භ කරන ලද අතර 2008 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2015 ජුනි 30 දක්වා අවස්ථා 6 කදී දීර්ඝ කර තිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
--------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම
------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ

අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම
------------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන
----------------

2.1 මතය
---------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම හැරුණු විට, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ(විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව.

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු
--------------------------

ව්‍යාපෘතිය විසින් රු.6,729,144 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද ස්ථාවර වත්කම් රේඛීය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන වෙනත් ව්‍යාපෘතියකට 2014 ජනවාරි 01 දින මාරු කර තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා ඒ පිළිබඳ රු.904,023 ක් වූ ක්ෂය කෙරීගෙන යන වැඩ වලට අයකර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන කෙරීගෙන යන වැඩ එම ගණනින් වැඩියෙන් දක්වා තිබුණි.

3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණයගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2014 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | 2014 වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | | 2014 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් |
|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ආ ස බැ | 15 | 1,476.75 | 218.8 | 1.68 | 218.76 | 1,759.71 |
| ශ්‍රී ලං ර | 05 | 492.25 | 3.0 | - | 2.14 | 385.64 |
| එකතුව | 20 | 1,969.00 | 221.8 | 1.68 | 220.90 | 2,145.35 |

3.2 භෞතික ප්‍රගතිය

ලැබුණු තොරතුරු අනුව, පළාත් මාර්ග නියෝජිතායතනවල සහභාගීත්වය ඇතිව මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය විසින් පුනරුත්ථාපන කටයුතු සඳහා ශක්‍යතා අධ්‍යයනයන් සිදුකිරීම හා විස්තරාත්මක සැලසුම් පිළියෙල කිරීමට ජාතික මාර්ග කිලෝමීටර 2,200 ක් හා පළාත් මාර්ග කිලෝමීටර 2,900 ක් තෝරාගෙන තිබුණි. කෙසේවුවද රු.මිලියන 1,965 ක පිරිවැයකට ජාතික මාර්ග කිලෝමීටර 3,165 ක් හා පළාත් මාර්ග කිලෝමීටර 3,119 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා උපදේශක සේවා සැපයීමට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. ඉන් ජාතික මාර්ග කිලෝමීටර 1,821 ක් හා පළාත් මාර්ග කිලෝමීටර 3,143 ක් සඳහා විස්තරාත්මක සැලසුම් හා ශක්‍යතා අධ්‍යයනයන් 2014 දෙසැම්බර් 31 දිනට නිමකර තිබුණි.

3.3 මතභේදයට තුඩුදෙන කරුණු

ව්‍යාපෘතිය විසින් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය හා මාර්ග ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදනය කරන ලද වත්කම් සඳහා පොදු ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද ස්ථාවර වත්කම් විගණනයේදී හඳුනාගැනීමට හා පරීක්ෂා කිරීමට නොහැකි විය.